සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## නර්තනය

කාලය පැය 01 විනාඩි 30යි.

නම / විභාග අංකයඃ

### I කොටස

- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ''දණ්ඩියමේ සරඹ'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(i) ගොඩ සරඹයි. (ii) පා සරඹයි. (iii) අත්සරඹයි. (iv) ඉලංගම් සරඹයි.

02. හනුමා වන්නම ගායනා කරනු ලබන්නේ,
(i) මාත්‍රා 2+2 තාල රූපයටය. (ii) මාත්‍රා 3+3 තාල රූපයටය.
(iii) මාත්‍රා 2+3 තාල රූපයටය. (iv) මාත්‍රා 4+4 තාල රූපයටය.

03. ඉරට ඔබිය ඉර මුදුනේ සිටියා.... මෙය,
(i) කළගෙඩි නැටුමට අයත් කවි පාදයකි. (ii) කුළු නැටුමට අයත් කවි පාදයකි.
(iii) ලී කෙළි නැටුමට අයත් කවි පාදයකි. (iv) තාලම් නැටුමට අයත් කවි පාදයකි.

04. විකල්ප වාද්‍ය උපකරණයක් නොවන්නේ,
(i) ටින් බෙරය (ii) චල් වළල්ල (iii) දඬුබෙරය (iv) තාලම්පට

05. තත් ජිත් තොං තම් තා යනු,
(i) පළමු ගොඩ සරඹයේ කස්තිරමයි. (ii) දෙවන ගොඩ සරඹයේ කස්තිරමයි.
(iii) දෙවන පා සරඹයේ හමාරපදයයි. (iv) තුන්වන ගොඩ සරඹයේ කස්තිරමයි.

- **6 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

6. වෙසක් උත්සවය ........................................................ මාසයේ යෙදෙයි.
7. 'කෝලාට්ටම්' ....................................................... ජන නැටුමකි.
8. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය ........................................................ වේ.
9. කෝලම් රටා චිත්‍රයට නගන්නේ ........................................................ උත්සවයේදීය.
10. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය .....................................................යි.

( ද්‍රවිඩ, දෙවොල් මඩුව, ගැටබෙරය, මැයි, තෛපොංගල් )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

11. පා සරඹ නැටීමෙන් පසු අවසානයේ නටනු ලබන පද කොටසක් වේ.

    ( කස්තිරම/ හමාරපදය )

12. හිංදු ජනයා ගොවිතැනට උපකාරී වන ස්වභාවධර්මයා වන්දනාමාන කරන උත්සවය වේ.

    ( නත්තල්/ තෛපොංගල් )

13. ගැමි නැටුම්වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි.

    ( සරල බව/ සංකීර්ණ බව )

14. නර්තනයක් ඉදිරිපත් කිරීමට පෙර සම්ප්‍රදායන් තුනෙහිම ආගමික වශයෙන් ආශිර්වාද ලබා ගැනීම සඳහා කරනු ලබන්නේ

    ( නම්‍යතා අභ්‍යාස/ නමස්කාරය )

15. තාලය තැබීම සඳහා මෙම වාදන භාණ්ඩය යොදා ගනී.

    ( තාලම්පට/ හොරණෑව )

- **පහත සඳහන් කියමන් හරිනම් (✓) ලකුණද වැරදිනම් (×) ලකුණද ඉදිරි කොටුවේ සඳහන් කරන්න.**

16. ලී කෙළි නැටුමක අවස්ථාවක් කැටයම් කර ඇත්තේ ඇම්බැක්කේ දේවාලයේය. ☐
17. නර්තනයේ මූලික ඉරියව්ව කස්තිරම වේ. ☐
18. සතුට ප්‍රදර්ශනය වීමට සිතේ ඇතිවන සිතිවිලි බලපායි. ☐
19. ''කෙළි'' යන වචනයේ තේරුම නැටීම යන්නයි. ☐
20. කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් සහයෝගය වර්ධනය වේ. ☐

**(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 20 ට ලකුණු 20 යි.)**

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු තව ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(1.) රූපය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i.) ගංගාවක් ආරම්භ වනුයේ කිනම් ස්ථානයක සිට ද? (ල. 02)

ii.) රූපයේ දැක්වෙන පරිදි දියඇල්ලේ සුන්දරත්වය වැඩිදියුණු වීම සඳහා එකතු වී ඇති ස්වාභාවික වස්තූන් මොනවාද? (ල. 04)

iii.) ''සුන්දර දියඇල්ල'' යන මෙයින් බිත්ති පුවත්පතකට සුදුසු කවියක් නිර්මාණය කරන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

(2.)

i.) උඩරට නර්තන සම්ප්‍රදාය පවතින ප්‍රදේශ තුනක් නම් කරන්න. (ල. 02)

ii.) පහත සඳහන් සම්ප්‍රදායන් දෙකේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙක නම් කරන්න.

පහතරට නර්තන සම්ප්‍රදාය :- ............................................................

උඩරට නර්තන සම්ප්‍රදාය :- ............................................................ (ල. 04)

iii.) හිස්තැනට අදාල පිළිතුර ලියන්න.

| ...................................... සම්ප්‍රදාය | ...................................... සම්ප්‍රදාය |
|---|---|
| තෙල්මේ ඇඳුම් කට්ටලය | |
| | පහන්මඩු ශාන්ති කර්මය |

(ල. 04)

(මුළු ලකුණු 10)

(3.)

i.) වෙසක් උත්සවයේ වැදගත්කම කෙටියෙන් ලියන්න. (ල. 02)

ii.) එම උත්සවය හා බැඳි සැරසිලි 2ක් නම් කරන්න. (ල. 02)

iii.) මෙම පෝය නිමිති කොට ගෙන ඔබ පාසලේ ක්‍රියාත්මක කළ ගායන/ වාදන/ නර්තන අවස්ථා සඳහන් කරන්න. (ල. 06)

(මුළු ලකුණු 10)

(4.)

i.) කාන්තාවන් සඳහා සුවිශේෂ වූ සිංහල ගැමි නැටුමක් නම් කරන්න. (ල. 02)

ii.) ගැමි නැටුමක සුවිශේෂී ලක්ෂණ 4ක් ලියන්න. (ල. 04)

iii.) ලීකෙළි හෝ කළ ගෙඩි ගැමි නැටුමකට අදාල කවියක් ලියන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

(5.)

i.) ඔබ පංති කාමරයේ දී නිර්මාණය කරන ලද විකල්ප වාද්‍ය භාණ්ඩ දෙකක නම් ලියන්න. (ල. 02)

ii.) එම වාදන භාණ්ඩ නිර්මාණය කර ගැනීමට යොදා ගත් අමුද්‍රව්‍ය මොනවාද? (ල. 04)

iii.) ''සාම්ප්‍රදායික වාදන භාණ්ඩ'' වාදනය කරන අවස්ථා 4ක් ලියන්න. (ල. 04)

(මුළු ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## නර්තනය (ප්‍රායෝගික පරීක්ෂණය)

නම / විභාග අංකයඃ

01. ගායනය

1. කැමති ගායනයක්
   නම් කරන ලද ගායනය
   ( ගුරුවරයාට අභිමත පරිදි ) ( ලකුණු 10 )

02. පා සරඹ

1, 2 පා සරඹය විලම්භ හා මධ්‍යලයට නැටීම.
(කුසපත් ඇදීම මගින් හෝ ගුරුවරයාට අභිමත පරිදි) ( ලකුණු 10 )

03. ගොඩ සරඹ

1, 2, 3 ගොඩ සරඹ එකක් මධ්‍යලයට නැටීම.
( ගුරුවරයාට අභිමත පරිදි ) ( ලකුණු 10 )

04. අලංකාර මාත්‍රා නැටීම.

මාත්‍රා 2 තාල රූපයට අලංකාර මාත්‍රයක් නර්තනය කරන්න. ( ලකුණු 10 )

05. කණ්ඩායම් ක්‍රියාකාරකම

I පාන්දරින් ඉස්කෝලෙට ගීතය හෝ මගේ පොඩි යාළු ගීතයට නර්තනය කිරීම. ( ලකුණු 10 )

**( ලකුණු දීමේ නිර්නායක ගුරුවරයාගේ අභිමතය පරිදි සකස් කරන්න. )**